00793

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී

(ගෞරව) උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3234- විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - සෞන්දර්ය සහ නිර්මාණාත්මක අධ්‍යයනය**

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2025.05.25 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට සහ II කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## I කොටස

01. "සෞන්දර්යාත්මක අධ්‍යාපනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? නිර්වචන භාවිත කර පැහැදිලි කරන්න.

02. නිර්මාණාත්මක කටයුතු සඳහා භාවිත කළ හැකි අපද්‍රව්‍ය හතරක් (04) නම් කරන්න.

03. ළමුන් තුළ දළ චාලක කුසලතා සංවර්ධනය කිරීම සඳහා සංගීත සහ චලන ක්‍රියාකාරකම් උපකාරී වන්නේ කෙසේද?

04. මුල් ළමාවිය අධ්‍යාපනයේදී භාවිත කරන රූකඩ වර්ග දෙකක් (02) සඳහන් කරන්න.

05. ළමා චිත්‍ර සඳහා ළමයින්ගේ නිර්මාණශීලීත්වය පෝෂණය කිරීමේදී ගුරුවරයාගේ කාර්යභාරය කුමක්ද? කරුණු තුනක් (03) ක් යටතේ කෙටියෙන් විස්තර කරන්න.

06. සංගීතය සහ රිද්මයානුකූල චලනයන් තුළින් සංවර්ධනය කළ හැකි කුසලතා හතරක් (04) නම් කරන්න.

07. ළමා චිත්‍ර වල ප්‍රධාන අවධි නම් කරන්න.

08. ප්‍රාථමික අධ්‍යාපනය තුළ එළිමහන් ඉගෙනුම් පරිසරය භාවිත කිරීමේ වාසි තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 05 X 08 =40 )

## II කොටස

09. I. ප්‍රාථමික අධ්‍යාපනය තුළ සෞන්දර්ය අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08 )

II. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල ප්‍රධාන ක්ෂේත්‍ර හතර (නිර්මාණාත්මක චලනය, නිර්මාණාත්මක සංගීතය, නිර්මාණාත්මක ක්‍රීඩා/නාට්‍ය සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්) කුඩා දරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමට දායක වන ආකාරය සාකච්ඡා කරන්න. එක් එක් ක්ෂේත්‍ර සඳහා අදාළ උදාහරණ භාවිත කරන්න.

(ලකුණු 12 )



37

10. I. ප්‍රාථමික අධ්‍යාපනය තුළ ඵලදායි සංගීත හා චලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 04 )

II. සංගීත සහ චලනය දරුවෙකුගේ පූර්ණ සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න. සංගීතය සහ චලන අත්දැකීම් හරහා සමාජ, චිත්තවේගීය, ශාරීරික, ප්‍රජානන සහ භාෂා කුසලතා සංවර්ධනය වන ආකාරය විස්තර කිරීමට උදාහරණ භාවිත කරන්න. (ලකුණු 08 )

III. "සංගීතය යනු ස්වයං ප්‍රකාශනයට සහ පුද්ගල සංවර්ධනයට උපකාර වන ප්‍රියජනක කලා ආකෘතියකි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද, මෙම ප්‍රකාශයට සුදුසු පිළිතුරු සඳහන් කරන්න. (ලකුණු 08)

11. I. නාට්‍යමය කතන්දර කීමෙන් දරුවන්ට ඉගෙනගත හැකි ප්‍රතිලාභ පහක් (05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 08)

II. කතන්දර කීමේ ක්‍රමයේ ප්‍රධාන කොටස් දෙකක් (02) පැහැදිලි කරන්න. මෙම ක්‍රමය ප්‍රාථමික පන්තිකාමරයේ භාෂාව සහ සදාචාරාත්මක සංවර්ධනයට සහාය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. I. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේදි පෙරපාසල්/ප්‍රාථමික පන්තිකාමර සඳහා රූකඩ භාවිතයේ වැදගත්කම් පහක් (05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05 )

II. ප්‍රාථමික පන්ති කාමරයක රූකඩ ආශ්‍රිත ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මඟ පෙන්වීම සහ පහසුකම් සැලසීමේදී ගුරුවරයාගේ කාර්යභාරය සහ (ලකුණු 07 )

III. රූකඩ නාට්‍ය, ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස ඵලදායී ලෙස භාවිත කිරීමට ගුරුවරයෙක් සංවර්ධනය කළ යුතු කුසලතා මොනවාද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 08 )

13. I. "කලාව යනු මුල් ළමාවියේ/ ප්‍රාථමික අධ්‍යාපනයේ ස්වයං ප්‍රකාශනය සඳහා මාධ්‍යයකි." ළමයින්ට වචන වලින් ප්‍රකශ කළ නොහැකි සිතුවිලි සහ හැඟීම් සන්නිවේදනය කිරීමට කලාව භාවිතා කරන ආකාරය ඉස්මතු කරමින් මෙම ප්‍රකාශය විචේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08 )

II. නිර්මාණාත්මක කලා ක්‍රියාකාරකම් ප්‍රාථමික දරුවන්ගේ චිත්තවේගීය, සමාජීය සහ ප්‍රජානන සංවර්ධනයට උපකාර වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12 )

-සියලුම හිමිකම් ඇවිරිණි.-



41